# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,305 - 2022 නොවැම්බර් මස 04 වැනි සිකුරාදා - 2022.11.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 846 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 850 |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 නොවැම්බර් මස 25 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 නොවැම්බර් මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## කුලියාපිටිය දිසා අධිකරණයේ දී ය

### වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

හලාවත දිසා අධිකරණ
නඩු අංකය : 4582/MB
ඇස්කිසි අංකය : 27/2017

හලාවත, කොටුව පාර, අංක 17 දරන ස්ථානයෙහි ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තා වූ, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, තැ. පෙ. 2085, කොළඹ 02 දරන ස්ථානයේ සිය ලියාපදිංචි ප්‍රධාන කාර්යාලය පිහිටි,

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත, තැ. පෙ. 2085, කොළඹ 02.

.....................*පැමිණිලිකරු*

*එදිරිව*

රන්කිරන් පේඩිදුරයලාගේ ශ්‍රියාත් දර්ශන ලයනල්,
දිගන්වෙල,
වැල්ලරාව.

..........................*විත්තිකරු.*

**අගනා දේපල වෙන්දේසියක්**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, යගම් පත්තු කෝරළේ, කටුගම්පල හත්පත්තුවේ බිංගිරිය ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් සීමාවේ, අලුත්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ලිනිදමන සහ පහළ කලුගම ග්‍රාමයෙහි පිහිටි ''තල්ගහපිටිය එස්ටේට්'' වර්ෂ 2015ක් වූ නොවැම්බර් මස 30 ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය සහ 2018.06.20 දිනැති අදළ දේපළ විකිණීමේ තහනම ඉවත් කරන ලෙස ඉදිරිපත් කළ විත්තිකරුගේ ඉල්ලීම නිෂ්ප්‍රභා කිරීමේ නියෝගය මත පැමිණිල්ලේ සඳහන් සම්පූර්ණ මුදල, නඩු ගාස්තු, නෛතික පොළිය, වෙන්දේසි ගාස්තු අයකර ගැනීමට පැමිණිලිකරුට අයිතියක් ඇති බවට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් එකී සහන ලබා ගැනීම සඳහා විත්තිකරුට අයත් කුලියාපිටිය අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් තහනමට ගෙන ඇති මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපල,

**වර්ෂ 2022ක් වූ දෙසැම්බර් මස 22 වැනි දින පෙ. ව. 11.00ට** එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම දේපල ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට උකස්කර ඇත්තේ රන්කිරන් පේඩිදුරයලාගේ ශ්‍රීයාත් දර්ශන ලයනල් යන අය විසිනි.

**දේපලට පිවිසීම.-**

හලාවත නගරයේ සිට කුරුණෑගල පාරේ කි. මී. 13 1/2 තල්ගහපිටිය ශාන්ත තෙරේසා පාසල පසුකරනවාත් සමගම දකුණට ඇති ගුරු පාරේ කොටස් කරනු ලැබූ ඉඩමේ එනම් තල්ගහපිටිය එස්ටේට් පාරේ මීටර් 800ක් ගොස් දකුණට හැරී එම පාරේ තවත් මීටර් 50 ගියවිට එම පාරේ වම් පස පිහිටා ඇත.

*පිස්කල් වෙන්දේසියේ විකිණීමේ කොන්දේසි.-*

- වෙන්දේසිය වෙනුවෙන් උසාවියට ගෙවිය යුතු ගාස්තු
- පළාත් පාලන ආයතන බදු වශයෙන් ගැනුම් මිලෙන් 1%
- වෙන්දේසි කටයුතු සඳහා වන මුදල් සහ ප්‍රචාරණ ගාස්තු
- විකිණීමේ සහතිකය සඳහා මුද්දර ගාස්තු

ඉඩම මිල දී ගැනීමට ඉල්ලුම් කරන ලද වටිනාකමෙන් 25%ක මුදලක් වෙන්දේසි කරනු ලබන අවස්ථාවේදී ම කුලියාපිටිය දිසා අධිකරණයේ පිස්කල්වරයා වෙත ගෙවිය යුතුවන අතර ඉතිරි 75%ක මුදල වෙන්දේසි දින සිට එළඹෙන තිස් වැනි දිනයේ දී හෝ එදිනට පෙර ගෙවිය යුතුය.

අදාළ දේපල පිස්කල් වෙන්දේසියේ විකිණීමේ කොන්දේසිවලට ඇතුළත් වේ.

මේ පිළිබඳ වැඩිදුර තොරතුරු හලාවත කොටුව පාර, අංක 17 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ ශාඛා කාර්යාලයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 032-2222594/032-2222666/32-7388151
ෆැක්ස් : 032-2222594
හිමිකම් හා වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 25% මුදල් ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, යගම් පත්තු කෝරළේ, කටුගම්පල හත්පත්තුවේ, බිංගිරිය ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ බිංගිරිය ප්‍රාදේශීය ලේකම් බල සීමාව තුළ, අලුත්ගම ග්‍රාම නිලධාරි වසම තුළ, ගිනිදමන සහ පහල කලුගම යන ග්‍රාමයන්හි පිහිටි තල්ගහපිටිය එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට වර්ෂ 2004-12-05 දින එම්. ජේ. ගෝමස් මිනින්දෝරු තැන විසින් මැන සකස් කරන ලද අංක 6878 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 73B දරන ඉඩමට මායිම්, උතුරට : හලාවත - හෙට්ටිපොල ප්‍රධාන මාර්ගයෙහි සිට ප්‍රාදේශීය සභා පාර දක්වා දිවෙන ඉහත කී පිඹුරෙහි ලොට් 27 දරන ප්‍රවේශ මාර්ගය ද, නැගෙනහිරට : ඉහත කී පිඹුරෙහි ලොට් 73A ද, දකුණට : ඉහත කී පිඹුරෙහි ලොට් 99 දරන ඉඩම ද සහ බටහිරට : ඉහත කී පිඹුරෙහි ලොට් 74 දරන ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සක් (පර්. 20) *හෙවත්* හෙක්ටයාර්ස් 0.00506ක වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් නිවාස ගොඩනැගිලි, ගහකොළ, පලතුරු සියලු දේ ද ඉහත කී පිඹුරෙහි ලොට් 27 දරන ප්‍රවේශ මාර්ගය සමග වේ. මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ආර්. 98/220 හි ලියාපදිංචි කර ඇත.

අධිකරණයේ අණ පරිදි,

එච්. පී. ඩී. අබේරත්න,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්.

දිසා අධිකරණය - කුලියාපිටිය.

11-30

---

**මහනුවර දිසා අධිකරණයේ දී ය**

**සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වන වගන්තියට අනුව පිස්කල් විසින් කරණු ලබන පිස්කල් විකිණීම**

සෙලාන් බැන්ක් පීඑල්සී,
(කලින් සෙලාන් බැන්ක් ලිමිටඩ් යනුවෙන් හඳුන්වන ලද)
සෙලාන් ටවර්ස්, අංක 90, ගාලුපාර, කොළඹ 03.
.....................*පැමිණිලිකරු.*

නඩු අංකය : DMB/00039/14
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 997,142/17
ඇස්කිසි අංකය :

*එදිරිව*

ගමගේ උපාලි රේණුකා සෙනවිරත්න,
අංක 513, කුරුණෑගල හංදිය,
අනුරාධපුර පාර, දඹුල්ල.

*සහ*

***නව ලිපිනය :***

සිසිර වත්ත,
කණ්ඩලම පාර, දඹුල්ල.
.......................*විත්තිකරු.*

මහනුවර දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2016 ක් වූ නොවැම්බර් මස 15 වැනි දින ලබාදෙන ලද නඩු තීන්දුව අනුව විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුව වෙත ගෙවිය යුතු මුදල් පැහැර හැර ඇති බැවින් පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති

පරිදි රුපියල් නව ලක්ෂ අනූ හත්දහස් එකසිය හතලිස් දෙකයි ශත දාහතක (රු. 997,142/17) මුදලක් සහ ණය ශේෂයවන රුපියල් හත් ලක්ෂ හතලිස් හත් දහසක (රු. 7,47,000/-) මුදල මත 2014.04.01 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් වර්ෂිකව සියයට විසි හයක (26%) බැගින් පොළිය සහ තීන්දු ප්‍රකාශ දිනයේ සිට සම්පූර්ණ මුදල ගෙවා අවසන්වන තෙක් නෛතික පොලියද, තව ද, අධිකරණයේ නිලධාරියකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට නියෝග කොට ඇති හෙයින් ද, ඒ අනුව ඉහත නම සඳහන් විත්තිකරුට අයත් දූනටමත් තහනමට ගෙන ඇති පහත උපලේඛනයේ සඳහන්වන දේපල පිස්කල් වෙන්දේසියේ විකුණා පැමිණිලිකාර බැංකුවට අයකර දීම සඳහා,

**වර්ෂ 2022ක් වූ දෙසැම්බර් මස 08 වැනි දින පෙ.ව. 11.00 එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.**

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ , මාතලේ උතුරෙහි වගාපනහ පල්ලෙසිය පත්තුවේ ග්‍රාම සේවා නිලධාරි වසම් අංක E445*A* හි රත්මල්ගහඇළහි පිහිටි "බුල්ගහයාය" නැමැති ඉඩමෙන් පර්චස් විස්සක් විශාලැති (අ. 0, රූඩ්. 0, පර්චස් 20) ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් 1986.10.04 දින මැන සකස් කරන ලද අංක 192 දරන පිඹුරෙහි ලොට් 49 වශයෙන් නිරූපිත ඉඩම් කොටසට මායිම් : උතුරින් ලොට් 81 ද, නැගෙනහිරින් ලොට් අංක 13ද, දකුණින් ලොට් 43 ද සහ බටහිරින් ලොට් 50 යන මායිම් තුළ පිහිටි ඉඩම සහ ඒ තුළ ඇති ගස් වැල් ඇතුලු සියලු දේත් ය.

එකී ඉඩම පහත සඳහන් පරිදි නැවත මැන සකස් කොට ඇත.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුරෙහි වගාපනහ පල්ලෙසිය පත්තුවේ ග්‍රාම සේවා නිළධාරී වසම් අංක E445A හි රත්මල්ගහඇළහි පිහිටි "බුල්ගහයාය" නැමැති ඉඩමෙන් පර්චස් විස්සක් විශාලැති (අ0.රූඩ්0.පර්චස් 20) ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරත්න විසින් 2011.06.05 දින මැන සකස් කරන ලද අංක 5267 දරණ පිඹුරෙහි ලොට් A වශයෙන් නිරූපිත ඉඩම් කොටසට මායිම් : උතුරින් : ඩබ්ලිව්. එස්. සී. එම්. අබේසේකර බලයලත් මිනින්දෝරුතැනගේ පිඹුරු අංක 192/86 හි ලොට් 81 න්ද, (අඩි 15ක් විශාල පාර), නැගෙනහිරින් : ඩබ්ලිව්. එස්. සී. එම්. අබේසේකර බලයලත් මිනින්දෝරුතැනගේ පිඹුරු අංක 192/86 හි ලොට් 81 න්ද, (අඩි 15ක් විශාල පාර), දකුණින් : ඩබ්ලිව්. එස්. සී. එම්. අබේසේකර බලයලත් මිනින්දෝරුතැනගේ පිඹුරු අංක 192/86 හි ලොට් අංක 43 න්ද, බටහිරින් : ඩබ්ලිව්. එස්. සී. එම්. අබේසේකර බලයලත් මිනින්දෝරුතැනගේ පිඹුරු අංක192/86 හි ලොට් 50 න්ද මායිම් වූ ඉඩම සහ ඒ තුළ ඇති ගස් වැල් ඇතුලු සියලු දේත් ය.

මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු D498/95 සහ D498/260 හි ලියාපදිංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
දඹුල්ල.

වර්ෂ 2022ක් වූ ඔක්තෝබර් මස 27 වැනි දින දී ය.

11-135

---

**පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි**

**කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත්බද වාණිජ මහාධිකරණයේ දී ය**

නඩු අංකය :- CHC/426/2019/MR
කොළඹ වාණිජ මහාධිකරණ
ඇස්කිසි අංකය :- 12/2022

සියපත ෆිනෑන්ස් පී.එල්.සී.

*පෙරදී*

සියපත ෆිනෑන්ස් ලිමිටඩ් සහ සම්පත් ලීසිං ඇන්ඩ් ෆැක්ටරින් ලිමිටඩ් වශයෙන් හඳුන්වන ලදී.

*ලියාපදිංචි ලිපිනය :*

අංක. 110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 02.

*ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය :*

අංක. 46/12, සයුරු සෙවණ, නවම් මාවත, කොළඹ 02.

.....................*පැමිණිලිකරු.*

*එදිරිව*

1. සිව්මෙක් කන්ස්ට්‍රක්ෂන් පුද්ගලික සමාගම,
   අංක. 156, 1/1,
   ඩබ්. ඒ. සිල්වා මාවත, කොළඹ 06.

2. මොහොමඩ් කාසීම් මොහොමඩ් අජ්වර්ඩ්
   අංක. 251,
   දෙමටගොඩ පාර, කොළඹ 09.

3. අබුබකර් මොහොමඩ් රාෆික්
   අංක. 251,
   දෙමටගොඩ පාර, කොළඹ 09.

4. සුල්තාන් ජමින් ෆාතිමා ෂාරා
   අංක. 400/2,
   බේස්ලයින් පාර, දෙමටගොඩ පාර, කොළඹ 09.

..........................විත්තිකරුවන්.

ඉහත නම් සඳහන් පළමු විත්තිකරු වෙතය.

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2021 ක් වූ ජූලි මස 30 වැනි දින දෙන ලද තීන්දුව ප්‍රකාරව, පළමුවන විත්තිකරු විසින් පැමිණිලිකරුට,

(අ) ඉහත කී ණය පහසුකම මත වර්ෂ 2018 ක් ජූලි මස 29 වැනි දිනට රු 91,486,429.96 ක මුදලක් සහ වර්ෂ 2018 ජූලි මස 30 වැනි දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වනතුරු මාසිකව 2% ක පොලිය පැමිණිලිකරුට අයකර දෙන ලෙසට 1 වන විත්තිකාර සමාගමට එරෙහිව අණකොට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින්,

(ආ) මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ එකී මුදල් ගෙවීම සඳහා බැඳී ඇති බවට හා ඒ සඳහා ඇස්කීසි ක්‍රියාත්මක කළ හැකි බවටත්,

(ඇ) තීන්දු ප්‍රකාශයේ සඳහන් දිනයේ සිට මාස දෙකක් ඇතුළත තීන්දු ප්‍රකාශිත මුදල පැමිණිලිකරුට ගෙවීමට විත්තිකාර සමාගම පැහැර හැරියහොත් මෙහි පහත උප ලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති දේපල ගරු අධිකරණය විසින් පත් කරනු ලබන බලයලත් වෙන්දේසිකරුවෙකු මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින්,

එකී තීන්දුව ඉටුකිරීමට පළමු විත්තිකාර සමාගම විසින් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින්, කොළඹ වාණිජ මහාධිකරණ නඩු අංක CHC/426/19/MR දරන නඩුව යටතේ නිකුත් කර ඇති ඇස්කීසිය ප්‍රකාරව, කොළඹ වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්/ නියෝජ්‍ය පිස්කල් වන මා විසින් වර්ෂ **2022 ක් වූ සැප්තැම්බර්** මස 02 වන දින නිසි ලෙස තහනම් කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපල,

**වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 29 වැනි දින පෙ. ව. 11.00 ට**

එකී දේපළ පිහිටා ඇති කොටහේන, වාසල පාර, වරිපනම් අංක 105 දරන ස්ථානයේ දී, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25%ක මුදලක් ද,
2. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 (අ) වගන්තිය යටතේ අයකිරීම් ද,

විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25%ක මුදලක් පමණක් නම්, ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75%ක මුදල දින 30ක් ඇතුළත කොළඹ, වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගර සභා සීමාව තුළ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොටහේන නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ, කොටහේනහි, වරිපනම් අංක 47, සුසාන භූමිය පාර සහ දැනට අංක 105, වාසල පාර දරන ඉඩමට අවසරලත් මිනින්දෝරු ලෝරන්ස් ද සිල්වා විසින් මැන සාදන ලද අංක 1903 ජනවාරි 10 දිනැති පිඹුර ප්‍රකාර මායිම් උතුරු නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස වන සී. පී. ප්‍රනාන්දුට අයිති ඉඩම ද, දකුණු නැගෙනහිරට : සුසාන භූමිය පාර හා

දනට වාසල පාර ද, දකුණු බටහිරට : වෙන්ගඩාසලාම් පිල්ලේට අයිති දේපලේ තාප්පය ද, උතුරු බටහිරට : බෞද්ධ විහාරයේ පරිශ්‍රය ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහනවයයි දශම නවයයි හතර (රූඩ්. 02, පර්චස් 19.94) විශාල ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි යනාදී සෑම සියළු දේත් වේ.

මෑතක දී සිදුකරන ලද මැණීමකට අනුව එකී ඉඩම පහත පරිදි වේ :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගරසභා සීමාව තුළ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කොටහේන නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ, කොටහේනහි, වරිපනම් අංක 105, වාසල පාරහි පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. පී නසූර් විසින් මැන සාදන ලද අංක : 21028 සහ 2010 ඔක්තෝබර් මස 30 වන දිනැති පිඹුර ප්‍රකාර ලොට් අංක. 01 දරන ඉඩමේ මායිම්, උතුරු නැගෙනහිරට : බෞද්ධ විහාරයේ පරිශ්‍රය ද, දකුණු නැගෙනහිරටඃ වරිපනම් අංක 109/1 දරන පරිශ්‍රය, වාසල පාර ද, දකුණු බටහිරට : වාසල පාර ද, උතුරු බටහිරටඃ වරිපනම් අංක 3/8, 5/8, සහ 6/8 පරිශ්‍රය සහ 8 වන පටුමග යන මායිම් තුළ පිහිටි පර්චස් දහනවයයි දශම තුනයි බිංදුවක් (පර්. 19.30) විශාල ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි යනාදී සෑම සියළු දේත් වේ.
මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු D186/14 වෙළුම හි ලියා පදිංචි වී ඇත.

*දේපළට පිවිසීම.-* කොළඹ කොටුව ඕල්කොට් මාවත ඔස්සේ මරදාන ටෙක්නිකල් හංදිය පසුකර ඉදිරියට යන විට හමුවන පංචිකාවත්ත වටරවුමෙන් වම්පසට හැරී ශ්‍රී සංඝරාජ මාවත ඔස්සේ කි. මී. 1.6ක් පමණ යන විට කොටහේන හංදිය හමුවේ. එතැනින් දකුණුපසට ඇති කොටහේන වීදියට හැරී මී. 250ක් පමණ ඉදිරියට යන විට දකුණු පසට හමුවන වාසල පාරට හැරී මී. 350ක් පමණ ඉදිරියට යන විට මාර්ගයේ වම්පස මෙම දේපල පිහිටා ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ.

වර්ෂ 2022ක් වූ නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය.

11-164

---

# විවිධ දැන්වීම්

## වල්පොල පියනන්ද අධ්‍යාපන සහ සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

සංජීව එදිරිමාන්න වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "වල්පොල පියනන්ද අධ්‍යාපන සහ සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සංගමය සංස්ථාගත කිරීමයි :-

*(අ)* ශිෂ්‍යත්ව ප්‍රදාන සහ තෑගි පිහිටුවා ඒවා සුදුසු ශ්‍රී ලාංකික ශිෂ්‍යයන්ට ලබා දීම හා ඔවුන්ගේ අධ්‍යාත්මික, දාර්ශනික, සංස්කෘතික, විද්‍යාත්මක හා කාර්මික අධ්‍යාපනය සඳහා සහාය වීම ;

*(ආ)* පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යෑම, සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය හා වැඩිදියුණුව සඳහා හිතකර යයි අදහස් කරනු ලබන පොත්, ප්‍රවෘත්ති පත්‍ර, වාර සඟරා හා අනෙකුත් ප්‍රකාශන මිල දී ගැනීම, ඒවාට දායක වීම හා ප්‍රකාශයට පත්කිරීම, සහ

*(ඇ)* සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය සමිති හා සංවිධාන සමග සම්බන්ධ වී සහයෝගයෙන් කටයුතු කිරීම ;

යනාදිය වේ.

සංජීව එදිරිමාන්න,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

11-214

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2022 වර්ෂය** | | | |
| **නොවැම්බර්** | 2022.11.04 | සිකුරාදා | 2022.10.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.11.11 | සිකුරාදා | 2022.10.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.11.18 | සිකුරාදා | 2022.11.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.11.25 | සිකුරාදා | 2022.11.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2022.12.02 | සිකුරාදා | 2022.11.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.09 | සිකුරාදා | 2022.11.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.16 | සිකුරාදා | 2022.12.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.23 | සිකුරාදා | 2022.12.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.30 | සිකුරාදා | 2022.12.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2023 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2023.01.05 | බ්‍රහස්පතින්දා | 2022.12.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.01.13 | සිකුරාදා | 2022.12.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.01.20 | සිකුරාදා | 2023.01.05 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2023.10.27 | සිකුරාදා | 2023.01.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.